Australian Government
Department of Home Affairs

ඕස්ට්‍රේලියානු ප්‍රජාවගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා ඕස්ට්‍රේලියාව සතුව දැඩි දේශ සීමා ක්‍රියාමාර්ග ඇත. ඕස්ට්‍රේලියාවේ සිට සහ ඕස්ට්‍රේලියාව වෙත ඉතාම සීමිත ගුවන් ගමන් පමණක් දැනට ඇති අතර, මෙම අවස්ථාවේදී ඔබට ගමන් කළ නොහැකි වීමට ඉඩ ඇත. සංචාරක සීමා වෙනස් විය හැක. නිතිපතා නැවත පරීක්ෂා කරන්න. බලන්න: ජාතික කැබිනට් මණ්ඩල මාධ්‍ය ප්‍රකාශන.

ආරක්ෂිත සංචාරක කලාපයකින් නිරෝධායනයෙන් නිදහස් ගුවන් ගමනකින් පැමිණෙන්නේ නම් මිස ඕස්ට්‍රේලියානු පුරවැසියන් ඇතුළු, ඕස්ට්‍රේලියාව වෙත පැමිණෙන සියලුම මගීන්, තමා පැමිණෙන තොටුපළේ ඇති හෝටලයක් වැනි නියම කරන ලද පහසුකමක දින 14 ක් නිරෝධායනය විය යුතුය. ගමන් කරන අය සඳහා වූ කොරෝනා වෛරස් (කෝවිඩ්-19) උපදෙස් බලන්න. ඔබගේ නිරෝධායනය සඳහා යන වියදම ඔබ විසින් දැරීමට සිදුවිය හැකිය. නිරෝධායන අවශ්‍යතා සම්බන්ධ වැඩිදුර විස්තර සොයා ගැනීම සඳහා අදාළ ප්‍රාන්ත සහ දේශභූමි රජයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වන්න.

# මා හට වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට අවශ්‍යයි

මෙම අවස්ථාවේ ඕස්ට්රේලියානු වීසා බලපත්‍රයකට අයැදුම් කිරීමේ අවශ්‍යතාවය ඔබ විසින් නැවත සලකා බැලිය යුතුය. ගමන් සීමා සහ වීසා අයදුම්පත්‍ර සලකා බැලීම සම්බන්ධ යාවත්කාලීනයන් සඳහා මෙම පිටුව නිතිපතා පරීක්ෂා කර බලන්න.

## වීසා අයදුම්පත්‍ර සලකා බැලීමේ වැඩපිළිවෙල

පහත අවස්ථාවල හැර ඔබට ඕස්ට්රේලියාවට පැමිණිය නොහැක:

- ඔබ සහන කාණ්ඩයකට අයත් නම්
- දැනට ඇති ගමන් සීමාවලින් තනි පුද්ගලයෙකු සඳහා වූ සහනයක් ලබා ඇතිනම් හෝ
- නිරෝධායනයෙන් නිදහස් ගමන් සැලසුමක් යටතේ ඔබ ආරක්ෂිත සංචාරක කලාපයක් තුළ ගමන් කරන්නේ නම්

ඔබට වලංගු වීසා බලපත්රයක් ද තිබිය යුතුය. ඔබේ වීසා විකල්ප සලකා බලන්න.

සමහර වීසා ක්‍රියාවලි සඳහා ගත වන කාලයට කෝවිඩ් -19 නිසා බලපෑම් ඇති වී ඇති හෙයින් අයදුම්පත් ක්‍රියාවලිය සම්පූර්ණ වීමට යම් කාලයක් ගත වෙයි. දැනට පවතින සංචරණ සීමා සඳහා සහනය ලබා ඇති ගමන් කරන්නන්ගේ හෝ ආරක්ෂිත ගමන් කලාපය තුළ ගමන් කරන්නන්ගේ වීසා අයදුම්පත් සඳහා අපි ප්‍රමුඛත්වය දෙන්නෙමු.

(ඔබ නවසීලන්ත පුරවැසියෙකු වේ නම් මිස) ඔබට වීසා ලැබෙන තෙක් ඔබගේ ගමන් විධිවිධාන තහවුරු නොකළ යුතුය.

හැකි සෑම අවස්ථාවකදී ම ඔබ අයදුම්පත මාර්ගගතව ඉදිරිපත් කළ යුතුය. මෙය සැකසුම් කටයුතු විධිමත් කිරීමට උපකාරී වේ.

## ඕස්ට්රේලියාවට පැමිණීම - වීසා විකල්ප

මාර්ගගතව, ගුවන් සේවයක් හරහා හෝ සංචාරක නියෝජිතයා හාරහා, ඉලෙක්ට්‍රොනික ගමන් අවසරයක් (ETA) සඳහා මෙවර ඉල්ලීම් කළ නොහැකි ය.

සංචරණ සීමා ඇති විට, අපි සමහර ගමන් බලපත්‍රධාරීන්ට ETA ඉල්ලුම් කිරීම සඳහා ජංගම යෙදුමක් (AustralianETA) අත්හදා බලමින් සිටිමු.

පහත අවස්ථාවලදී AustralianETA යෙදුම ඔස්සේ ETA සඳහා අයැදුම් කළ හැකිය:

- සියලු ETA සුදුසුකම් අවශ්‍යතා සපුරා ලන්නේ නම්, සහ
- ඔබ බෲනයි, කැනඩාව, හොං කොං (චීනයේ විශේෂ පරිපාලන කලාය), ජපානය, මැලේසියාව, සිංගප්පූරුව, දකුණු කොරියාව, හෝ එක්සත් ඇමරිකානු ජනපදය යන රටවල ගමන් බලපත්‍රයක් දරයි නම්.

AustralianETA භාවිත කරන ETA එකකට ඉල්ලුම් කිරීමට ආපසු නොගෙවනු ලබන AUD 20 ක සේවා ගාස්තුවක් අය කෙරේ. ETA එකක් ඔබට ඕස්ට්‍රේලියාව තුළ වැඩ කිරීමට හෝ මාස තුනකට වැඩි කාලයක් රැඳී සිටීමට අවසර නොදෙයි.

ඔබට AustralianETA එක App Store (Apple) හෝ Google Play (Android) වෙතින් බාගත හැක.

AustralianETA පරීක්ෂණයට ඇතුළත් නොවන සංචාරකයින්ට ඔවුන්ගේ අවශ්‍යතාවලට ගැළපෙන වෙනත් වීසා බලපත්‍රයක් සඳහා ImmiAccount හරහා මාර්ගගතව අයදුම් කළ හැකිය.

- • යුරෝපීය ගමන් බලපත්‍ර හිමියන් eVisitor (651 වෙනි උප පන්තිය) වීසා සඳහා සුදුසුකම් ලැබිය හැකිය. eVisitor වීසා බලපත්‍ර අයදුම්පතක් සඳහා වීසා අයදුම්පත් ගාස්තුවක් (VAC) හෝ සේවා ගාස්තුවක් නොමැත.

- • අනෙකුත් ගමන් බලපත්‍ර හිමියන් අදාළ විෂය ධාරාවේ Visitor (600 වෙනි උප පංතිය) වීසා බලපත්‍රයක් සඳහා සුදුසුකම් ලැබිය හැකිය.

ඔබට ETA, eVisitor හෝ Visitor වීසා බලපත්‍රයක් දී ඇති පමණින් ඔබට ඕස්ට්‍රේලියාවට යාම සඳහා සහනයක් ලබා දීමට සලකා බලා හෝ ලබා දී ඇති බව අදහස් නොවේ. ඔබ ආරක්ෂිත සංචාරක කලාපය තුළ ගමන් කරන්නේ නම් මිස, ගමන් සහනයක් සඳහා ඉල්ලුම් කළ යුතු අතර ඔබේ ඉල්ලීමට අදාළ සාධක සැපයිය යුතුය.

## සේවා සඳහා බාධා ඇති වීම

කෝවිඩ්-19 හේතුවෙන් වීසා අයදුම්පත්‍ර සම්බන්ධ සමහර සේවාවලට බලපෑම් ඇතිවී තිබිය හැකි අතර අපට අවශ්‍ය සේවා කිහිපයක් ලබාගත නොහැකි වේ.

මේවා අතර විදේශ පැනල් වෛද්‍යවරුන් (පහත බලන්න), ඉංග්‍රීසි භාෂා විභාග පහසුකම්, ජීවමිතික රැස් කිරීමේ මධ්‍යස්ථාන ඇතුළු වෙයි.

මෙම සේවා ලබා ගත නොහැකි කාලයේදී බොහෝ අයදුම්කරුවන් හට වීසා අවශ්‍යතා සපුරාලිය නොහැක. පරීක්ෂණ සම්පූර්ණ කර ගැනීමට සහ ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීම සඳහා අයදුම්කරුවන් හට අමතර කාලය දෙනු ලැබේ.

## වීසා බලපත්‍ර සම්බන්ධ වෛද්‍ය හමුවීම්

කෝවිඩ්-19 හේතුවන් වීසා බලපත්‍ර සම්බන්ධ වෛද්‍ය සේවා සම්බන්ධ බාධා ඇති බවට සේවාදායකයන් දැනගත යුතුය.

මෙම බාධා සම්බන්ධයෙන් අයදුම්පත් සලකා බලන නිලධාරීන් අවබෝධයෙන් සිටී. ඔබගේ වීසා අයදුම්පත් සලකා බැලීමේදී වැඩිපුර ගත වන කාලය සැලකිල්ලට ගනු ලැබේ. මගේ සෞඛ්‍ය ප්‍රකාශනය තාවකාලිකව අත්හිටුවා ඇත. ඔබ අපේක්ෂා කරන වීසා බලපත්‍රය සඳහා වන සෞඛ්‍ය පරීක්ෂණ ඇතුළු අවශ්‍යතා ඔබගේ වීසා බලපත්‍ර අයදුම්පත ඉදිරිපත් කළ පසු තීරණ කෙරේ.

ඔබේ *සෞඛ්‍ය පරීක්ෂණ ඉල්ලීමේ* ලිපියේ ඉල්ලූ කාල රාමුවට අනුව ඔබට සෞඛ්‍ය පරීක්ෂණයට ලක් විය නොහැකි නම්, ඔබ ඔබගේ ImmiAccount එක හරහා විස්තර අමුණා දෙපාර්තමේන්තුවට දැනුම් දිය යුතුය.

ඔබ වීසා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර නැතිනම් හෝ සංක්‍රමණ වෛද්‍ය පරීක්ෂණයකට යාමට ඉල්ලා නැති අවස්ථාවල, ඕස්ට්‍රේලියාවේ වීසා වෛද්‍ය සේවා සායනයක් හෝ විදේශ පැනල් සායනයක් හා සම්බන්ධ වීම අවශ්‍ය නොවේ.

## ජීවමිතික රැස් කිරීමේ හමුවීම්

ඕස්ට්රේලියානු වීසා අයදුම්පත් මධ්යස්ථාන (Australian Visa Application Centres (AVACs)) සහ ඕස්ට්රේලියානු ජීවමිතික රැස් කිරීමේ මධ්යස්ථාන (Australian Biometrics Collection Centres (ABCCs)) ඔස්සේ ජීවමිතික රැස් කිරීම නැවත ආරම්භ කිරීම තීරණ වන්නේ රට තුළ ඇති කෝවිඩ්-19 සීමා පදනම් කර ගෙන ය.

සමහර එකතු කිරීමේ මධ්‍යස්ථාන මගින් මාර්ගගත වීසා බලපත්‍ර අයදුම් කිරීමේ සේවා ලබා ගත හැකිය.

ඔබට හමුවීමක් පිළියෙල කර ගැනීම හෝ හමුවීමකට යාම සඳහා *පුද්ගලික හඳුනා ගැනීම් (ජීවමිතික) ලබා දීම අවශ්‍ය බව කියැවෙන ලිපිය* උපයෝගී කර ගත හැකිය. ඔබ ඔබගේ වීසා අයදුම් පත්‍රය සඳහා මාර්ගගතව අයදුම් කළේ නම්, ඔබගේ ImmiAccount හි මෙම ලිපියේ පිටපතක් ඇත.

හමුවීමක් පිළියෙල කර ගැනීම සඳහා ඔබගේ ප්‍රදේශයේ AVAC හෝ ABCC සමග සම්බන්ධ විය යුතුය. ඔබගේ රටෙහි AVAC සහ ABCC සමග සම්බන්ධ වීම සඳහා තොරතුරු සහ විවෘතව තබන වේලා ඇතුළු යාවත්කාලීන තොරතුරු සඳහා අපගේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න. බලන්න: [ඕස්ට්‍රේලියාවට පිටතින් ඇති කාර්යාල]

රටවල් තුළ ඇති කෝවිඩ්-19 සීමා හේතුවෙන්, සමහර ස්ථානවල ඔබට ජීවමිතික ලබා දීමට නොහැකි බව සම්බන්ධයෙන් අපි අවබෝධයෙන් සිටිමු. පහත අවස්ථාවල අප සමග සම්බන්ධ වීම අවශ්‍ය නොවේ:

- ඔබගේ ප්‍රදේශයේ රැස් කරන මධ්‍යස්ථානය තාවකාලිකව වසා ඇති නම්, හෝ
- ඔබගේ ප්‍රදේශයේ ඇති ලොක්-ඩවුන් හේතුවෙන් රැස් කරන මධ්‍යස්ථානයකට ගමන් කිරීම වැළැක්වෙන අවස්ථාවල.